# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## කතෝලික ධර්මය

විභාග අංකය:..........................................

| ශ්‍රේණිය 11 | I පත්‍රය | කාලය පැය 01 |
|---|---|---|

- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

---

1. විශ්වයේ හා මිනිසාගේ ආරම්භය පිළිබඳව වාර්තා කරන්නේ,
   I. උත්පත්ති පොත යි.
   II. නික්මයාම පොත යි.
   III. ලෙවී ව්‍යවස්ථාව යි.
   IV. ගණන් කථාව යි.

2. පූජකවරයේ පූර්ණත්වය හිමිවන්නේ,
   I. රාජගුරුප්‍රසාදි ධූරයට
   II. පාප් ධූරයට
   III. පූජකවරයට
   IV. පොදු පූජකවරයට

3. ''දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු ....................................................'' හිස්තැනට සුදුසු යෙදුම වන්නේ,
   I. සැනසීම ලබන්නෝ ය.
   II. තෘප්තිමත් වන්නෝ ය.
   III. දයාව ලබන්නෝ ය.
   IV. දෙවියන් වහන්සේ දකින්නෝ ය.

4. මේ අතුරින් ද්විතීය සම්මත ග්‍රන්ථ යුගලයක් වන්නේ,
   I. නික්මයාම සහ ගණන් කථාව
   II. තෝබිත් සහ ජුද්
   III. මීකා සහ මලාකි
   IV. ජුදිත් සහ බාරුක්

5. දිවැසිවරුන් හෙවත් ''නබී'' යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය වන්නේ,
   I. කෙනෙකු වෙනුවෙන් කතා කරන්නා.
   II. දේව කැමැත්ත නොහොත් පණිවිඩය අන් අයට ප්‍රකාශ කරන තැනැත්තා.
   III. දෙවි සමිඳුන්ගේ ආසිරි ලැබූ තැනැත්තා.
   IV. විශේෂ කැඳවීමක් ලැබූ තැනැත්තා.

6. ''මනුෂ්‍ය පුත්‍රය, මේ පොත අනුභව කර ගොස් ඉශ්‍රායෙල් වංශයට කතා කරන්නැ'' යි දෙවියන් වහන්සේ වදාළේ,
   I. යෙසායා දිවැසිවරයාට ය.
   II. එසකියෙල් දිවැසිවරයාට ය.
   III. ජෙරමියා දිවැසිවරයාට ය.
   IV. එලියා දිවැසිවරයාට ය.

7. නොදැවෙන කටු පඳුර තුළින් දෙවියන් වහන්සේ දර්ශනය වූයේ,
   I. ආබ්‍රහම්ට ය.
   II. මෝසෙස්ට ය.
   III. සාමුවෙල්ට ය.
   IV. එලියාට ය.

8. කතෝලික සභාව පුරාණ ගිවිසුම ලෙස සලකනු ලබන්නේ ................................ පිටපතෙන් ලැබී ඇති පොත් 46 යි. හිස්තැනට සුදුසු යෙදුම වන්නේ,
   I. රෙපරමාදු
   II. හෙබ්‍රෙව්
   III. සෙප්ටුවාජින්ත
   IV. ලතිං

9. දේශක දිවැසිවරුන් පිළිබඳව තොරතුරු, ඔවුන්ගේ වචන හා ක්‍රියා දක්නට ලැබෙන්නේ,
   I. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ ය.
   II. පංච පුස්තකයේ ය.
   III. ද්විතීය සම්මත ග්‍රන්ථවල ය.
   IV. 1-2 සාමුවෙල් සහ 1-2 රාජාවලිය ග්‍රන්ථවල ය.

10. මැවීම පිළිබඳ පළමු කථාවට අනුව දේවධාර්මික අර්ථයකින් මැවිල්ල දින හතකට සීමා කර ඇත්තේ,
   I. දෙවියන් වහන්සේගේ ක්‍රියාශීලී බව පෙන්වීමට ය.
   II. මැවීම පිළිබඳ පළමු කථාව පූජක සම්ප්‍රදායේ සම්පාදනයක් බව පෙන්වීමට ය.
   III. සබත් දිනයේ වැදගත්කම ඉස්මතු කිරීමට ය.
   IV. සියලු මැවිලි අතර උතුම් ම මැවිල්ල මිනිසා බව පෙන්වීමට ය.

11. ශුද්ධ බයිබලයේ අපට හමුවන දේශක දිවැසිවරුන් වන්නේ,
   I. ජෙරමියා, යෙසායා, මීකා
   II. එලියා, එලීෂා, නාතාන්
   III. යෙසායා, ජෙරමියා, එසකියෙල්
   IV. එසකියෙල්, දානියෙල්, එලියා

12. නීරෝගේ පීඩනයට හසුව දුක්විඳි ජනතාවට බලාපොරොත්තු ඇති කරමින් රචනා කරන ලද ශුභාරංචිය වන්නේ,
   I. මතෙව් ශුභාරංචිය
   II. මාක් ශුභාරංචිය
   III. ජොහාන් ශුභාරංචිය
   IV. ලූක් ශුභාරංචිය

13. දෙවියන් වහන්සේ ආදි මව්පියන් සමග ගිවිසුමක් ඇතිකර ගැනීමට පසුබිම් වූයේ,
   I. ආදි මවුපියන් දේව හඬට පිටු පා අකීකරු වීම යි.
   II. දෙවියන් වහන්සේගේ ම සමාන කමට මිනිසා මැවීම යි.
   III. ආදම් දෙවියන් වහන්සේ සමග උයනේ සක්මන් කිරීම යි.
   IV. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සියලු මැවිලිවලට වඩා මිනිසාට ප්‍රේම කිරීම යි.

14. ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤා කිරීමට කැඳවාගෙන යන ලද්දේ,
   I. ජේදුරු තුමා, ජාකොබ් තුමා සහ ජුවාම් තුමා ය.
   II. ජේදුරු තුමා, පාවුලු තුමා සහ ජුවාම් තුමා ය.
   III. සියලු ම අපෝස්තුළුවරුන් ය.
   IV. මාක් තුමා, ලූක් තුමා සහ මරිය මග්දලේනා ය.

15. පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව වන්නේ,
   I. තෙහෙල් ගී ගායනා කිරීම යි.
   II. යාග පූජා පුද කිරීම යි.
   III. මංගල්‍යයන් සැමරීම යි.
   IV. දේව මාලිගාවට ඇතුළු වීම යි.

16. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ශාරීරික සූදානමක් වශයෙන් නිරාහාරශීලීව සිටිය යුත්තේ,
   I. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට පෙර පැයක කාලයක් ය.
   II. හැකි උපරිම කාලයක් ය.
   III. දිව්‍ය පූජාව ආරම්භ කිරීමට පෙර අවම වශයෙන් පැයක කාලයක් ය.
   IV. දිව්‍ය පූජාවට සහභාගී වීමට සූදානම් වන මොහොතේ සිට ය.

17. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ගේ පාද සේදීමේ සිදුවීම වාර්ථා කරන්නේ,
   I. මතෙව් ශුභාරංචියේ ය.
   II. මාක් ශුභාරංචියේ ය.
   III. ලූක් ශුභාරංචියේ ය.
   IV. ජොහාන් ශුභාරංචියේ ය.

18. ශුභාරංචි කතුවරුන් හතර දෙනා ම වාර්ථා කරන එක ම ප්‍රාතිහාර්යය වන්නේ,
   I. අංශභාග රෝගියා සුව කිරීමේ ප්‍රාතිහාර්යය යි.
   II. නායිම් නුවර වැන්දඹුවගේ පුත්‍රයා මරණින් නැගිටුවීමේ ප්‍රාතිහාර්යය යි.
   III. වතුර වයින් කිරීමේ ප්‍රාතිහාර්යය යි.
   IV. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යය යි.

19. බ්‍රිතාන්‍ය යුගයේ මෙරට සේවය සඳහා පැමිණි ධර්මදූත නිකායක් වන්නේ,
   I. ෆ්‍රැන්සිස්කානු පියවරුන්ගේ නිකාය යි.
   II. සුරදූත පැවිදි නිකාය යි.
   III. ඔරතෝරියිනු නිකාය යි.
   IV. ජේසු නිකාය යි.

20. ශුද්ධ වූ සභාව තුළ පැවතිය යුතු අනිවාර්ය ලක්ෂණයක් වන 'ඒකත්වය' යන්නේ අදහස් වන්නේ,
   I. ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇති බව යි.
   II. රෝමානු කතෝලික සභාව පමණක් පැවතිය යුතු බව යි.
   III. ශුද්ධ වූ සභාවේ එකමුතුකම යි.
   IV. ශුද්ධ වූ සභාවේ විශ්වීය බව යි.

21. අති උතුම් ෆ්‍රැන්සිස් පාප් වහන්සේගේ බෞතීස්ම නාමය වූයේ,

I. ජෝර්ජ් මාරියෝ බර්ගෝලියෝ
II. කැරෝල් වොයිටිල්ලා
III. ජෝශප් රැට්සිංග
IV. ෆ්‍රැන්සිස් මාරියෝ

22. 'මනුෂ්‍ය පුත්‍රයාණෝ කවරෙක් ය කියා මිනිස්සු කියත් දැ'යි ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයින්ගෙන් ඇසුයේ,

I. ජෙරුසලමේදී
II. බෙතානියේදී
III. පිලිප්පි කයිසාරියේදී
IV. ගලීලයේදී

23. එළිදරව් සාහිත්‍යය තුළ සුදුමැලි වර්ණයෙන් සංකේතවත් කරන්නේ,

I. යුද්ධය හා ලේ වැගිරීම්
II. සාගතය
III. ජයග්‍රහණය
IV. මරණය

24. ජීවිතයේ හරය, එහි ගැටලු සහ විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව විග්‍රහ කරනුයේ,

I. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව යි.
II. අභිධාර්මික ප්‍රඥාව යි.
III. එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව යි.
IV. රාජ්‍ය සභා ප්‍රඥාව යි.

25. පාස්කු ඉරුදින එම්මාවුස් නම් ගමට යමින් සිටි ගෝලයන් දෙදෙනා ජේසුස් වහන්සේ හඳුනා ගත්තේ,

I. මග දී ශුද්ධ ලියවිල්ල පැහැදිලි කරන විට දී ය.
II. කෑමට හිඳගත් කල රොටී ආශිර්වාද කර පූප කඩන විටදී ය.
III. අප සමග නතර වුව මැනව යි කී විට දී ය.
IV. උන්වහන්සේ ගේ අත්ල හා ඇලය පෙන්වූ විට දී ය.

26. ශුද්ධාත්මයාණන් වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙන් මරිය තුමිය ඇතුලු ශ්‍රාවක පිරිස ජේසුස් වහන්සේගේ සවර්ගාරෝහණයේ සිට යාච්ඤාවෙන් ගත කළ දින ගණන වනුයේ,

I. 40
II. 50
III. 7
IV. 10

27. ශුද්ධ වූ ස්තේපන් තුමා ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා ලෙස මරණයට පත් වූයේ,

I. හිස ගසා දැමීමෙනි.
II. කුරුසියේ ඇන ගැසීමෙනි.
III. ගල් ගැසීමෙනි.
IV. දියේ ගිල්වීමෙනි.

28. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කර ගත් ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ,

I. බෞතීස්මය යි.
II. පාස්කු භෝජනය යි.
III. ජර්ම ඡේදනය යි.
IV. ගිවිසුම් කරඬුව යි.

29. 'අන්‍ය ජාතීන්ගේ අපෝස්තුලුවරයා' යන ගෞරව නාමයෙන් හඳුන්වනු ලැබුවේ,

I. ශුද්ධ වූ ලූක් තුමා ය.
II. ශුද්ධ වූ පාවුලු තුමා ය.
III. ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා ය.
IV. දෙවන ජුවාම් පාවුලු පාප් වහන්සේ ය.

30. සලමොන් රජතුමා දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ,

I. විනිශ්චය තේරුම් ගැනීමට ඥානය යි.
II. සතුරු රාජධානි යටත් කර ගැනීම සඳහා ශක්තිය යි.
III. ධනය සහ සම්පත් බහුල ධනවත් රාජ්‍යයක් වීම යි.
IV. රාජ්‍ය එක්සේසත් කර අධිරාජ්‍යයක් බවට පත් කරන ලෙස යි.

31. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීම සඳහා අප සිදු කළ යුතු පළමු ණය යුතුකම වන්නේ,

I. දිව්‍ය පූජාවට සහභාගී වීම යි.
II. යාච්ඤා මෙහෙයන් සංවිධානය කිරීම යි.
III. පොදු වැඩකටයුතු වෙනුවෙන් වැඩි කාලයක් කැප කිරීම යි.
IV. දේවස්ථානය ආශ්‍රිතව වැඩි කාලයක් ගත කිරීම යි.

32. යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් හෝ හූනියම් කිරීම විරුද්ධ වන්නේ,

I. දෙවන පනතට යි.
II. පළමු පනතට යි.
III. තුන්වන පනතට යි.
IV. හයවන පනතට යි.

33. බලාපොරොත්තුවට විරුද්ධ පාපයක් වන ඉච්ඡාභංගත්වය යනු,
I. තමාට ගැලවීමක් නැතැයි සිතීම යි.
II. සිත්හැරීමක් නැතිව තමාට ගැලවීම ලබාගත හැකි බව සිතීම යි.
III. තම ගැලවීම හා පව් සමාව දෙවියන් වහන්සේගෙන් යයි බලාපොරොත්තු නොවීම යි.
IV. දුෂ්කර අවස්ථාවලදී බලාපොරොත්තු අත්හැර දැමීම යි.

34. මතෙව් 20:26ට අනුව ඔබ අතරෙන් ප්‍රධානියා වීමට කැමති තැනැත්තේ,
I. ඔබ අතර යහපත් අයෙකු විය යුතු ය.
II. ඔබ අතර ඥානවන්තයා විය යුතු ය.
III. ඔබ අතර ශක්තිවන්තයා විය යුතු ය.
IV. ඔබගේ දාසයා විය යුතු ය.

❖ 35, 36 සහ 37 ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත තොරතුරු පරිශීලනය කරන්න.
A - බිඳ වැටුණු සබඳතාව නැවත ගොඩ නැගෙයි.
B - ජන්ම පාපයට සමාව ලැබෙයි.
C - ඇතුළාන්ත සැනසීම ලැබෙයි.
D - සදාකාලික ජීවිතය කරා එතෙර වීමට සූදානම් කිරීම.
E - දේව රාජ්‍යයේ පංගුකාරීත්වය ලැබෙයි.
F - ආත්ම ගැලවීමට ගෝචර වන්නේ නම් ශාරීරික සුවය ලැබීම.

35. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය තුළින් ඔබට ලැබෙන වරප්‍රසාද වන්නේ,
I. D සහ F ය.
II. C සහ E ය.
III. A සහ F ය.
IV. A සහ C ය.

36. ප්‍රසාද ස්නාපනය දේව ප්‍රසාද නිධානය තුළින් ඔබට ලැබෙන වරප්‍රසාද වන්නේ,
I. A සහ F ය.
II. B සහ F ය.
III. B සහ E ය.
IV. C සහ F ය.

37. රෝගීන්ගේ ආලේපය දේව ප්‍රසාද නිධානය තුළින් ඔබට ලැබෙන වරප්‍රසාද වන්නේ,
I. D සහ F ය.
II. D සහ E ය.
III. A සහ F ය.
IV. B සහ F ය.

38. 'මරණයට පත් වුනත් මම මගේ දේව ජීවිතය නැතිකර ගන්නේ නෑ' කියා ජේසුස් වහන්සේට දුන් පොරොන්දුව ඉටු කරමින් වයස අවුරුදු 12 දී තම ජීවිතය පූජා කලේ,
I. ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමිය.
II. කල්කටාවේ ශුද්ධ වූ තෙරේසා මව්තුමිය.
III. ජේසුගේ කුඩා මල, ශුද්ධ වූ තෙරේසා තුමිය.
IV. ශාන්ත ඇලෝසියස් ගොන්සාගා මුනිතුමා.

39. පංච පුස්තකය සම්පාදනය කිරීමේදී අනුශාසනාත්මක භාෂා ශෛලිය යොදා ගත්තේ,
I. ද්විතීය නීති සම්ප්‍රදාය යි.
II. එලොහිම් සම්ප්‍රදාය යි.
III. යාවේ සම්ප්‍රදාය යි.
IV. පූජක සම්ප්‍රදාය යි.

40. පාරාවෝ දෙවියන් වහන්සේගේ බලපරාක්‍රමය පිළිනොගෙන තම සිත දැඩි කර ගැනීමේ විපාකය වූයේ,
I. ඉශ්‍රායෙල් සෙනගට යන්නට අවසර ලබා දීම යි.
II. රතු මුහුද තරණය කිරීමට පාරාවෝගේ සේනාවට නොහැකි වීම යි.
III. ඉශ්‍රායෙල් සෙනග මිසරයේ වහල් භාවයෙන් නිදහස ලැබීම යි.
IV. මිසර වැසියන්ට වසංගත දහයකට මුහුණ දීමට සිදුවීම යි.

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## කතෝලික ධර්මය

විභාග අංකය:...........................................

| ශ්‍රේණිය 11 | II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න (05) පහකට පමණක් පිළිතුරු ලියන්න.

---

1. ප්‍රශ්න සියල්ලට ම කෙටි පිළිතුරු ලියන්න.

    1. කිතුනු විවාහයේ පරමාර්ථ දෙක ලියන්න.
    2. රාජගුරු ප්‍රසාදීන් වහන්සේ පූජකවර අපේක්ෂකයාට පූජාත්වරයේ දේව ප්‍රසාද නිධානය දනය කිරීම සඳහා සිදුකරන සුවිශේෂී ක්‍රියාවන් දෙකක් සඳහන් කරන්න.
    3. ලේඛක දිවැසිවරුන් අතරින් ප්‍රධාන දිවැසිවරුන් දෙදෙනෙකු නම් කරන්න.
    4. මතෙව් ශුභාරංචිය සඳහා භාවිතවන වෙනත් නම් දෙකක් ලියන්න.
    5. ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්ධනය කිරීමට මිසරයේ රජතුමා අනුගමනය කළ පියවර දෙකක් ලියන්න.
    6. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කර ගත් ගිවිසුමේ අඩංගු පොරොන්දු දෙකක් නම් කරන්න.
    7. ප්‍රසාද ස්නාපන පොරොන්දු බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
    8. දේව දූතයා සෙකරියස් තුමාට ස්නාවක ජුවාම් තුමාගේ උපත පිළිබඳව දැනුම් දුන් අවස්ථාවේ එතුමා පිළිබඳව කරන ලද ප්‍රකාශ දෙකක් ලියන්න.
    9. තාපස පැවිදි ජීවිතයකට විනය මාලාවක් සකස් කළ තාපස දිවියේ පුරෝගාමීන් ලෙස සැලකිය හැකි ශුද්ධවන්තයින් දෙදෙනෙකු නම් කරන්න.
    10. පැවිදි ජීවිතයේ ලක්ෂණ දෙකක් ලියන්න.

2.

    1. පදවි පූජක පොරොන්දු දෙක ලියන්න.
    2. පැවිදි සොයුරියන්ගේ නිකායන් තුනක් නම් කරන්න.
    3. පොදු පූජකවරයෙන් ඔබට පැවරෙන ධර්මදූතික කාර්යය ඉටු කිරීම සඳහා ගිහි අපෝස්තලික සේවා හරහා ඔබට කළ හැකි සේවාවන් පහක් කෙටියෙන් විස්තර කරන්න.

3.

    1. උත්පත්ති 3:6 ට අනුව සර්පයාගේ උපායෙහි රැවටුනු ස්ත්‍රියගේ රුචිය කථා කළ ආකාරය ඉස්මතු කරන යෙදුම් දෙකක් ලියන්න.
    2. රුචියට වහල් වී ස්ත්‍රිය විසින් හොඳ නරක අවබෝධ කරගැනීමේ ගසින් එල කඩා කෑමට ගත් වැරදි තීරණයෙන් අපට උගත හැකි පාඩම් තුනක් ලියන්න.
    3. අප ජීවත්වන සමාජයේ පාපය ක්‍රමක්‍රමයෙන් වර්ධනය වීමට බලපාන රුචිකත්වයන් පහක් පෙන්වා දී, ඒවා අපගේ යහපත වෙනුවෙන් පමණක් යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

4.

1. දිව්‍ය පූජාව තුළ අපට හඳුනාගත හැකි ප්‍රධාන කොටස් (පිළිවෙත්) දෙක නම් කරන්න.
2. ක්‍රිස්තුන් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේදී සිදු කළ කාර්යයන් තුනක් ලියන්න.
3. දිව්‍ය පූජාව අවසානයේ ධර්මදූතික කාර්යයක් සඳහා අපව පිටත් කර හරින බැවින් ක්‍රිස්තු ප්‍රේමයේ පණිවිඩය එදිනෙදා ජීවිතය තුළ ඔබ ජීවත් කරවන ආකාරය කරුනු පහක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

5.

1. දේව අනාවරණයේ මූලාශ්‍ර දෙක නම් කරන්න.
2. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි සැකැස්මෙහි හඳුනාගත හැකි අවස්ථා තුනක් ලියන්න.
3. ශුද්ධ වූ පාවුලු තුමාගේ ආදර්ශය අනුව යමින් පාසල් සිසුවකු වන ඔබ ශුභාරංචියේ දූතයකු වන්නේ කෙසේදැයි කරුනු පහක් යටතේ පැහැදිලි කරන්න.

6.

1. දේව රාජ්‍යය යනු දේව ............................. සහ දේව ........................... නතුවීම යි. හිස්තැන්වලට සුදුසු යෙදුම් පිළිවෙලින් ලියන්න.
2. දේවරාජ්‍යයේ වටිනාකම් පිළිබඳ ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමා තුනක් නම් කරන්න.
3. දේව රාජ්‍යයේ වටිනාකම් අනුව දිවි ගෙවීමට ශ්‍රී ලාංකේය සාරධර්ම තුළින් ලැබෙන පිටිවහල කරුනු පහකින් විසතර කරන්න.

7. තෝරාගත් මාතෘකා දෙකක් යටතේ කෙටි සටහන් ලියන්න.

1. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය
2. අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
3. ඉශ්‍රායෙල් ජනතාව නික්මයාම ගමන තුළ දිව්‍ය සංරක්ෂණය අත්දැකීම
4. ශුද්ධ වූ පාවුලු තුමාගේ හසුන් වර්ගීකරණය